| | | |
|---|---|---|
| **නිපුණතාව 5.0** | : | ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. |
| **නිපුණතා මට්ටම 5.2** | : | ශ්‍රී ලාංකේය නර්තන කලාවේ සාහිත්‍ය කලා පෝෂණය සඳහා දායක වූ පර්යේෂණාත්මක ලේඛන/කෘති පිළිබඳ තොරතුරු විස්තර කරයි. |
| **ක්‍රියාකාරකම 5.2** | : | පර්යේෂණාත්මක ලේඛන/කෘති පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරමු. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 02 |
| **ඉගෙනුම් පල** | : | • ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන්ට අයත් පර්යේෂණාත්මක ග්‍රන්ථ හා කතුවරුන් නම් කරයි.<br>• නර්තන අධ්‍යාපනයේ ප්‍රගමනයට මෙම පර්යේෂණ ලේඛන/කෘති ඉවහල් වී ඇති අයුරු විස්තර කරයි.<br>• විවිධ විෂය ක්ෂේත්‍ර යටතේ මෙම පර්යේෂණ සිදු කර ඇති ආකාරය සාකච්ඡා කරයි. |


# පර්යේෂණාත්මක ලේඛන/කෘති පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරමු.

ශ්‍රී ලාංකීය නර්තන කලාව පිළිබඳ තොරතුරු අධ්‍යනය කිරීමෙහිලා දේශීය වාර්තා හා කෘති පර්යේෂකයන් ගෙන් ලැබී ඇති දායකත්වය ඉමහත්ය .මන්ද ඔවුන් නර්තන කලාව පිළිබඳ තොරතුරු අධ්‍යනය කොට විවිධ පර්යේෂණ වල යෙදී සොයා ගන්නා ලද තොරතුරු අනාගත පරපුරට දායාද කිරීම නිසා නර්තන

කලාවේ ඉදිරි අභිවෘර්ධිය ගොඩ නැගී ඇත .ඒ අනුව අනාගත පරපුර වශයෙන් අප ඒ පිළිබඳ සොයා බැලීම ඉතාම වැදගත්ය .

නර්තන කලාව පිළිබඳ ලිඛිත ග්‍රන්ථ රචනා වීම ආරම්භ වී ඇත්තේ 20 වන ශත වර්ෂයේ සිටය . 20 වන ශතවර්ෂය ආරම්භය තෙක්ම නර්තන විෂය හා සම්බන්ධ බොහෝ කරුණු ඒ ඒ ශිල්පියාගේ අවශ්‍යතාවය පුරණය කර ගැනීම සඳහා පුස්කොල අත් පිටපත් වල සටහන් කර තිබිණි. 1908 වර්ෂයේ රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාකාවට **මහවැලතැන්න බණ්ඩාර මහතා ඉදිරිපත් කල** “ KANDYAN MUSIC “ නමැති ලිපිය නිසා විශාල ප්‍රබෝධයක් ඇතිවිය .1972 පාසල් විෂය නිර්දේශයට අනුව සෞන්දර්ය අධ්‍යාපනය අනිවාර්ය විෂය වශයෙන් නම් කිරීම නිසා 1893 දී රජයේ ලලිත කලා ආයතනය ආරම්භවීමෙන් පසු 1980 වේ දී කැළණි විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යාපනය ආයතනය බවට පත්විය .පසුව වර්ෂයේදී සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය බවට පත් වීමත් සමග විශ්ව විද්‍යාල මට්ටමේ පර්යේෂණ කෘති රාශියක් බිහිවී ඇත .

ඒ අනුව උඩරට ,පහතරට ,සබරගමු ,යන සම්ප්‍රදායන් තුනට අදාලව බිහිවූ පර්යේෂණ කෘති රාශියක් ඇති අතර ඉන් කිහිපයක් පිළිබඳව අධ්‍යනය කිරීම මෙමගින් සිදුවේ .




| <u>මුල් යුගයේ ලේඛකයන්</u> | <u>දෙවන යුගයේ ලේඛකයන්</u> | <u>තෙවන යුගයේ ලේඛකයන්</u> |
|---|---|---|
| ජෝන් කැලවේ | ජේ .ඊ.සේදරමන් | මහාචාර්ය මුදියන්සේ දිසානායක |
| ඔක්තාකර් පර්ටෝල් | එස් .එච් .සවුරිස් සිල්වා | මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ |
| | | මහාචාර්ය ලයනල් බෙන්තරගේ |
| | | මහාචාර්ය තිස්ස කාරියවසම් |
| | | ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ |

විශේෂයෙන් මෙහිදී සාකච්ජාවට භාජනය වන්නේ තෙවන යුගයේ ලේඛකයන්ය.

**මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතාගේ පර්යේෂණ කෘති**

උඩරට නර්තන සම්ප්‍රදායය පිළිබඳ උපාධියක් ලබා ගත් මුදියන්සේ දිසානායක මහතා නර්තන විෂයයේ විද්වතුන් අතරින් මහාචාර්ය පදවියක් ලබා ගත් ප්‍රථම ලාංකිකයා වේ. මෙතුමා සම්පාදනය කර ඇති ග්‍රන්ථ අතරින් පහත සඳහන් ග්‍රන්ථ හඳුනා ගැනීමට යොමු කර තිබේ.

| **කර්තෘගේ නම** | **ලියන ලද කෘතිය** | **විෂය ක්ෂේත්‍රය** | **විෂය අන්තර්ගතය** |
|---|---|---|---|
| මහාචාර්ය මුදියන්සේ දිසානායක | කොහොඹායක් කංකාරිය හා සමාජය (1998) | උඩරට නර්තන සම්ප්‍රදායය | කොහොඹා කංකාරි ශාන්ති කර්මයට ආවේණික සියළු තොරතුරු |
| | සිංහල නර්තන කලාව (1993) | දේශීය නර්තන සම්ප්‍රදායයෝ | නර්තන සම්ප්‍රදාය තුන පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු හා නර්තන විකාශනය පිළිබඳ තොරතුරු |

මීට අමතරව වලියක් මංගලා ,කන්‍යා යාගය ,කඩවර කංකාරිය ,මුට්ටි නැමිල්ල ආදී කෘති ගණනාවක් රචනාකර ඇත .



මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා

**මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතාගේ පර්යේෂණ කෘති**

පහතරට නර්තන සම්ප්‍රදායය පිළිබඳ ව විශ්වවිද්‍යාල උපාධියක් ලබා ගත් රුහුණේ උපන් මෙතුමා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපති වශයෙන් සේවය කර තිබේ. නර්තන විෂයය හා සබැඳි ග්‍රන්ථකරණයට යොමු වී සිටිය මෙතුමාගේ ග්‍රන්ථ අතරින් කීපයක තොරතුරු පහත සඳහන් වේ.

| කර්තෘගේ නම | ලියන ලද කෘතිය | විෂය ක්ෂේත්‍රය | විෂය අන්තර්ගතය |
|---|---|---|---|
| මහාචාර්ය ජයසේන කෝට්ටෙගොඩ | පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය (1995) | පහතරට නර්තන සම්ප්‍රදාය | පහතරට ශාන්තිකර්මවල දක්නට ලැබෙන රංග ශෛලීන් පැහැදිලි ව හා විස්තරාත්මක ව දැක්වීම. රිද්දි යාගය, සූනියම් ශාන්තිය, මහසොහොන් සමයම, සන්නි යකුම මේවායේ නාට්‍යමය ලක්ෂණ සමයන් පෙළපාලි හා සන්නිවේදන |
| | භාරතීය සම්භාව්‍ය නර්තන කලාව (2001) | භාරතීය නර්තන සම්ප්‍රදායයෝ | භරත නාට්‍ය, කථක්, කථකලි හා මණිපුරි නර්තනය පිළිබඳ තොරතුරු<br><br>රසභාව හා අභිනය පිළිබඳ තොරතුරු |



මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ

මීට අමතරව මෙතුමා ප්‍රයෝගික පහතරට නර්තනය 1-2 යන පොත් දෙකද මැණික් පාල ශාන්තිය,සූනියම් කැපිල්ල ආදී කෘති ගණනාවක් රචනා කර ඇත.

**මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාගේ පර්යේෂණ කෘති**

සිංහල විෂයානුබද්ධ ව මහාචාර්ය ධූරයක් දැරූ තිස්ස කාරියවසම් මහතා නර්තනය හා සබැඳි පර්යේෂණ කෘති කිහිපයක් සම්පාදනය කර ඇත. මෙ අතරින් පහත සඳහන් කෘති පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීම වැදගත් වේ.

| කර්තෘගේ නම | ලියන ලද කෘතිය | විෂය ක්ෂේත්‍රය | විෂය අන්තර්ගතය |
|---|---|---|---|
| මහාචාර්ය තිස්ස කාරියවසම් | ශාන්තිකර්ම සහ සිංහල සමාජය (1998) දෙවන මුද්‍රණය | නර්තන හා බැඳි ශාන්තිකර්ම | යක් තොවිල්<br>පත්තිනි දේවිය හා යකුන් පිළිබඳ තොරතුරු<br>විවිධ උපත් කතා<br>ශාන්තිකර්මවල සමාජ සම්බන්ධය |
| | රටයකුම හෙවත් රිද්දි යාගය (1995) | පහතරට නර්තන සම්ප්‍රදාය | රටයකුම යාගයේ<br>පූජාවිධි රටාව<br>රටයකුමේ එන කවි<br>නාට්‍යමය ලක්ෂණ |



මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා

මිට අමතරව මෙතුමා ගම්මඩු පුරාණය ,මහසොහොන් සමයන් විමර්ශනය ආදී කෘති ගණනාවක් රචනා කර ඇත.

## ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මියගේ පර්යේෂණ කෘති

සබරගමුව නර්තන සම්ප්‍රදායය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය ඒ පිළිබඳ පර්යේෂණ ග්‍රන්ථ සම්පාදනය කර ආචාර්ය උපාධියක් ලබාගත් ප්‍රථම ලාංකික කාන්තාව ලෙස නම් කළ හැකි ය. ඒ අතරින් පහත සඳහන් ග්‍රන්ථ පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත් වේ.

| කර්තෘගේ නම | ලියන ලද කෘතිය | විෂය ක්ෂේත්‍රය | විෂය අන්තර්ගතය |
|---|---|---|---|
| ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය | සබරගමු නර්තන කලාව (2000) | සබරගමු නර්තන සම්ප්‍රදායය | සබරගමු නැටුම් පිළිබඳ තොරතුරු දේව ශාන්ති, යක් තොවිල්, ග්‍රහ පන්ති, සබරගමු වන්නම්, එහි නිශ්චිත නාදමාලා සහිත ව ප්‍රස්තාර ගත කොට දැක්වීම ශාස්ත්‍රීය නර්තන නාට්‍යමය පෙළපාලි මාත්‍රා සහ ප්‍රස්තාර කර දැක්වීම ආදී තොරතුරු |
| | සමන් දේවාල පුද සිරිත් (2008) | සබරගමු නර්තන සම්ප්‍රදාය | සමන් දේවාලයේ පෞරාණික චාරිත්‍ර පෙරහැර මංගල්‍යය පිළිබඳ තොරතුරු සහ සමන් දෙවියන් පිළිබඳ මතවාද නිවැරදි කොට සාධක සහිතව ඉදිරිපත් කිරීම. |



ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය

**මහාචාර්ය ලයනල් බෙන්තරගේ පර්යේෂණ කෘති**

සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය වරයකු වශයෙන් සේවය කරන මෙතුමා පහතරට නර්තන හා සම්බන්ද කෘති ගණනාවක් රචනා කර ඇත.කළුකුමාර යග පිළිවෙල,සින්දු වන්නම් විමර්ශන ,ආදී කෘති ද රචනා කර ඇත .

| කර්තෘගේ නම | ලියනලද කෘති | විෂය ක්ෂෙත්‍රය | විෂය අන්තර් ගතය |
|---|---|---|---|
| මහාචාර්ය ලයනල් බෙන්තරගේ | පහතරට ශාන්තිකර්මවල වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ | පහතරට නර්තන සම්ප්‍රදාය | සුනියම් යාගය ඇතුළු ඇතැම් යාගයන්හි නිශ්චිත සැරසිලි වල ලක්ෂණ බටහිර වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ හා සමාන තවක් දක්වන බව . |
| | සිංහල සැරසිලි කලාව | පහතරට නර්තන සම්ප්‍රදාය | සිංහල සංස්කෘතිය තුල පවතින ගොක් කොළ නිර්මාණ ඇතුළු ස්වභාවික අමුද්‍රව්‍ය යොදා ගනිමින් කරන ලද නිර්මාණ |



**මහාචාර්ය ලයනල් බෙන්තරගේ**

මෙසේ ශ්‍රී ලංකාවේ නර්තන කලාව හා සම්බන්ද විවිධ උගතුන් විසින් ලිපි ලේඛන මාර්ගයෙන් දක්වා ඇති නව අදහස් හා මතවාද දෙස බලන කල්හි පෙනීයන්නේ එම තොරතුරු සමහර අවස්ථාවල විද්‍යාත්මක වශයෙන්ද සනාථ වන බවය .මේ අනුව ඉදිරි පරම්පාර සඳහානර්තනය රැක ගැනීමට මෙය පිටුවහලක් වන බව පැහැදිලිය .

ඇගයීම :- * නර්තන කලාව හා සම්බන්ද කතුවරු 03 දෙනෙක් හා ඔවුන් ගේ කෘති ද සඳහන් කරන්න.

* නර්තන කලාවේ අභිවෘර්දිය සඳහා ලේඛන හා කෘති වල දායකත්වය පැහැදිලි කරන්න

* ඉන් ඔබ කැමති කෘතියක් ඇසුරු කරගෙන සාකච්චා කරන්න .

සැකසුම :- M.G.N.ප්‍රියදර්ශනී (නර්තන ගුරු )

පාසල :-කන්දෙගෙදර කනිෂ්ට විද්‍යාලය